SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026

Third Term Test - Grade 13 - 2026

විභාග අංකය: .....

ඉන්දීය ඉතිහාසය - 25A S I,II

කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය මිනි. 10 යි.

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1206 දක්වා

- අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනිමටත් යොදා ගන්න.
- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- කොටස් දෙකටම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

- අංක 1-10 තෙක් ප්‍රශ්න සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන මත ලියන්න.

(01) (1) ගෝධාවරී (2) මහානදී (3) නර්මදා
(4) කෘෂ්ණ (5) කාවේරි (.....)

(02) (1) ශ්‍රාවස්ති (2) පුරුෂපුර (3) කෞෂම්බි
(4) අංග (5) පාඨලීපුත්‍ර (.....)

(03) (1) තාම්‍රලිප්ත (2) සුප්පාරක (3) භාරුකච්ඡ
(4) පාඨලීපුත්‍ර (5) කල්‍යාණි (.....)

(04) (1) මොහෙන්ජොදාරෝ (2) ආම්රි (3) බයිබර්
(4) හරප්පා (5) සුක්තජොන්දෝර් (.....)

(05) (1) රඝුවංශය (2) මේඝදූතය (3) ඍතු සංහාරය
(4) ජානකීහරණය (5) කුමාර සම්භවය (.....)

(06) (1) හින්දුකුෂ් (2) සුලෙයිමාන් (3) හිමාලයා
(4) සත්පුර (5) තප්ති (.....)

(07) (1) ඉබන්බතූතා (2) අල්බීරුණි (3) මොහොමඩ් අලි ජින්නා
(4) හියුංසාං (5) ඔරාබි පාෂා (.....)

(08) (1) බිම්බිසාර (2) උදයන (3) අනුරුද්ධ
(4) සශාංක (5) අජාසත්ත (.....)

(09) (1) මදුරෙයි (2) කාංචිපුරම් (3) සෝම්නාත්
(4) මාමල්ලපුරම් (5) තංජෝර් (.....)

(10) (1) වත්සරාජ (2) ධ්‍රැව (3) ධර්මපාල
(4) හර්ෂවර්ධන (5) නාගභට (.....)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න වූ සඳහා පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

(11) (1) මස්කි සෙල්ලිපිය - සාතවාහන
(2) හිටරි - ස්කන්ධගුප්ත
(3) ගාන්ධාර - කණිෂ්ක
(4) අයිහෝල් - දෙවන පුලකේශීන්
(5) හතිගුම්ඵා සෙල්ලිපිය - බාරවේල (.....)

(12) (1) පතංජලි - මහාභාෂ්‍ය
(2) අශ්වඝෝෂ - සාරිපුත්‍ර ප්‍රකරණය
(3) පාහිණී - අෂ්ටාධ්‍යායී
(4) කාලිදාස - දශ කුමාර චරිතය
(5) භාස - ස්වප්න වාසවදත්තා (.....)

(13) (1) මගධ - බිම්බිසාර
(2) ගාන්ධාර - පුක්කුසාති
(3) අවන්ති - වස්සකාර
(4) කෝසල - පසේනදී
(5) වත්ස - උදයන (.....)

(14) (1) සීමුක - සාතවාහන
(2) ගොන්ඩොපර්නිස් - පාර්තියන්
(3) පළමුවනි ස්ට්‍රාටෝ - යවන
(4) චෂ්ටන - කාන්ව
(5) නහපාන - ශක (.....)

(15) (1) වාතාපිකොණ්ඩ - පළමුවන නරසිංහවර්මන්
(2) සකල උත්තරාපථනාථ - හර්ෂවර්ධන
(3) අමිත්‍රඝාත - අශෝක
(4) දක්ෂිණාපථනාථ - පළමුවන සාතකර්ණී
(5) වික්‍රමාදිත්‍ය - දෙවන චන්ද්‍රගුප්ත (.....)

- **අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන/ දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලකට නොවේ. X හා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස්කල විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය වරහන් තුළ ලියන්න.**

	X		Y
(16)	1. කෘෂ්ණ	A	මාල්වා උස්බිම්
	2. සින්දු	B	හිමාලයා
	3. චම්බාල්	C	ඩෙකැන් සානුව
	4. බ්‍රහ්මපුත්‍ර	D	හිමාලයා
	5. මහානදී	E	ටිබෙටය

(1) ACBDE (2) ADEBC (3) DBAEC
(4) BDAEC (5) BECAD (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(17)

1. කාලිදාස		A	බුද්ධ චරිතය
2. වරාහමිහිර		B	සාකුන්තලය
3. භාරවී		C	දශ කුමාර චරිතය
4. දණ්ඩීන්		D	කිරාතාර්ජුනීය
5. අශ්වඝෝෂ		E	බෘහද් සංහිතා

(1) BACED (2) BEDCA (3) CABED
(4) CBAED (5) CDAEB (.....)

(18)

1. තෝරමාන		A	ශක ශත්‍රප
2. නහපාත		B	ප්‍රතිහාර
3. ඩෙම්ට්‍රියස්		C	හූණ
4. හුවිෂ්ක		D	කුෂාණ
5. වත්සරාජ		E	ඉන්දු ග්‍රීක

(1) BACED (2) BDAEC (3) CAEDB
(4) CBAED (5) CDAEB (.....)

(19)

1. අන්තර්වසික		A	අයකැමි
2. මන්ත්‍රී- පර්ෂද්		B	අමාත්‍ය මණ්ඩලය
3. සමාහර්ත		C	නගරපාලක
4. අන්තපාල		D	අන්තඃපුර පාලක
5. නාගරක		E	දේශසීමා ආරක්ෂක

(1) CABED (2) CDEBA (3) DBAEC
(4) DBAEC (5) DCBAE (.....)

(20)

1. කඩුන්ගෝන්		A	පල්ලව
2. පලමුවන පුලකේෂීන්		B	රාෂ්ත්‍රකූට
3. තුන්වන ගෝවින්ද		C	චාලුක්‍ය
4. සිංහ විෂ්ණු		D	චෝළ
5. විජයාලය		E	පාණ්ඩ්‍ය

(1) ADCBE (2) BEDCA (3) DABEC
(4) DBAEC (5) ECBAD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

(21) කාලිදාස

(1) කාලිදාස යනු, දෙවන චන්ද්‍රගුප්ත රාජ සභාවේ සිටි එක් පඬිවරයෙකි.
(2) රඝුවංශය හා කුමාරසම්භවය මොහුගේ ශ්‍රේෂ්ඨ කාව්‍ය ග්‍රන්ථ දෙකකි.
(3) භාරවී කාලිදාසගේ ශිෂ්‍යයෙක් විය.
(4) ශ්‍රී ලංකාවේ කුමාරදාස රජු කාලිදාසගේ සමකාලීනයකු ලෙස සැලකේ.
(5) කාලිදාස සන්දේශ කාව්‍ය සම්ප්‍රදායේ ආදිකර්තෘ ලෙස සැලකේ. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(22) මෞර්යයන් යටතේ පාඨලීපුත්‍ර නගරයේ පරිපාලනය.
(1) නගරය පාලනය කරන ලද්දේ තිස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් මඟිනි.
(2) කමිටුවේ ප්‍රධානියා වූයේ නගර ගුත්තිකය.
(3) කමිටුව අනුකමිටු හයකට බෙදා තිබුණි.
(4) නගරය ආරක්ෂා වූයේ දැවයෙන් කළ පවුරකින් හා දිය අගලකිනි.
(5) වෙළඳපොලේ විකුණන ලද භාණ්ඩවලින් බද්දක් අය කරන ලදී. (.....)

(23) ගුප්ත සංස්කෘතිය.
(1) ගුප්ත යුගයේ දී බොහෝ සාහිත්‍ය කෘති සංස්කෘත භාෂාවෙන් ලියැවුණි.
(2) ආගම්, සාහිත්‍ය, කලාව සහ විද්‍යාවේ වර්ධනයට රටේ අභ්‍යන්තර ආරක්ෂාව හා සෞභාග්‍ය හේතු විය.
(3) මෙම යුගයේ දී බ්‍රාහ්මණ ආගම හින්දු ආගම බවට පත් විය.
(4) සාරානාථ බුදු පිළිමය මෙම යුගයේ උසස් මූර්තියක් ලෙස සැලකේ.
(5) මෙම යුගයේ වඩාත් වන්දනාවට ලක් වූයේ ඉන්ද්‍ර දෙවියන්ය. (.....)

(24) හර්ෂවර්ධන රජතුමා
(1) මොහු මහායාන බෞද්ධාගම ඇදහූවකු විය.
(2) තම සහෝදරයාගේ මරණයෙන් පසු හර්ෂවර්ධන ථානේෂ්වරයේ රජ විය.
(3) හර්ෂවර්ධන රජුගේ දකුණේ යුධ ව්‍යාපාරය චාලුක්‍ය වංශික දෙවන පුලකේශීන් විසින් ව්‍යාර්ථ කරන ලදී.
(4) හර්ෂවර්ධන විසින් සසංක මරා බෙංගාලය යටත් කරගන්නා ලදී.
(5) පුරාණ ඉන්දියාවේ අන්තිම අධිරාජ්‍ය නිර්මාපකයා ලෙස ඇතැම් ඉතිහාසඥයින් විසින් වර්ෂවර්ධන හඳුන්වනු ලැබේ. (.....)

(25) චෝළ දේවාල
(1) චෝළ දේවාලවල ප්‍රධාන අංගය වූයේ මණ්ඩප, අන්තරාලය සහ ගර්භ ගෘහය යි.
(2) ගෝපුරම් ද හින්දු දේවාලවල කැපී පෙනෙන අංගයක් විය.
(3) සුප්‍රසිද්ධ රථ සම්ප්‍රදායේ ආරම්භකයෝ චෝළයෝය.
(4) තංජෝරයේ සමහර දේවාලවලින් චෝළ රජවරුනගේ ප්‍රතිමාද හමුවේ.
(5) චෝළ රජවරු දේවාලවලට විශාල ධනයක් පරිත්‍යාග කළහ. (.....)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

(A) හා (B) පමණක් නිවැරදි නම් ..... 1 **(A) හා (C) පමණක් නිවැරදි නම් 2**
(B) හා (C) පමණක් නිවැරදි නම්..... 3 **(C) හා (D) පමණක් නිවැරදි නම් 4**
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ..... 5 ද තීන් ඉර මත ලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය				
1	2	3	4	5
(A) සහ (B) පමණක් නිවැරදි ය.	**(A) සහ (C) පමණක් නිවැරදි ය.**	**(B) සහ (C) පමණක් නිවැරදි ය.**	**(C) සහ (D) පමණක් නිවැරදි ය.**	**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය.**

(26) වෛදික යුගය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදිවේ ද?
(A) ඍග් වේදයෙහි විත්ද්‍යා කඳුවැටිය හා නර්මදා ගඟ ගැන සඳහන් වේ.
(B) ඍග් වෛදික ජනයා ආහාරයට ගත්තේ එළවළු වර්ග පමණි.
(C) ඍග් වෛදික ජනයා ගෝත්‍රවලට බෙදී සිටියහ.
(D) භරතයන්ගේ රජු වූ සුදාස් විසින් දස ගෝත්‍රික සංයුක්තයේ නායක වූ විශ්ව මිත්‍ර පරාජය කරන ලදී. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(27) ස්කන්ධ ගුප්ත සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද?

(A) ස්නද්ධ ගුප්ත සිය පියා වූ කුමාර ගුප්ත විසින් පුෂ්‍ය මිත්‍රයන්ට විරුද්ධව සටනට යැවීය.

(B) අධික වර්ෂාන නිසා බිඳී ගිය සුදර්ශන ජලාශය ස්කන්ධගුප්ත විසින් පිළිසකර කරන ලදී.

(C) ඔහු දැඩි ශිව භක්තිකයෙකු විය.

(D) ස්කන්ධගුප්තගේ මරණයත් සමඟ අභ්‍යන්තර අරගල නිසා ගුප්ත අධිරාජ්‍ය බිඳ වැටුණි. (.....)

(28) ඉන්දියාවේ ශක පාලනය සම්බන්ධ කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද?

(A) ශකවරු පැමිණියේ මධ්‍යම ආසියාවෙන්ය.

(B) ශකවැර ක්‍රි. පූ. 75 පමණ දී සින්ධ්හි බලය පිහිට වූහ.

(C) ශක පාලකය යටතේ පැවති මථුරා සහ තක්ෂිලා උතුරු ශත්‍රප ලෙස හැඳින්විණි.

(D) ශකවරු පාලනය කළ මාල්වා සහ කතියවාර් ප්‍රදේශ හඳුන්වන ලද්දේ බටහිර ක්ෂත්‍රප ලෙසිනි.
(.....)

(29) පුෂ්‍යභූති රජ පෙළපත සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද?

(A) ථානේෂ්වර්හි පුෂ්‍යභූති රාජ වංශයේ ආරම්භකයා ප්‍රභාකරවර්ධන විය.

(B) හර්ෂවර්ධනගේ යුධ ප්‍රයාන පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පාහියං විසින් වාර්තා කොට ඇත.

(C) හර්ෂවර්ධනගේ සොහොයුරිය මෞඛරී වංශයේ ග්‍රහවර්මන්ට පාවා දෙන ලදී.

(D) ප්‍රභාකරවර්ධනගේ පුත්‍ර හර්ෂවර්ධන කනෞජය අත්පත් කර ගත්තේ සසංක පළවා හැරීමෙනි.
(.....)

(30) සාතවාහනයෝ සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද?

(A) සාතවාහන රාජධානියේ ආරම්භක පාලකයා පළමුවන සාතකර්ණීය.

(B) පුරාණ ග්‍රන්ථවල සාතවාහනයෝ ආන්ද්‍රයෝ ලෙස හඳුන්වා ඇත.

(C) සාතවාහන රාජ්‍ය පිහිටුවන ලද්දේ නැගෙනහිර ඩෙකැනයේ ය.

(D) සාතවාහනයෝ ඩෙකැන් බලය ලබාගත්තේ එහි සිටි කාන්වයන් නෙරපා දැමීමෙන් අනතුරුවය.
(.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

(31) ඍග් වෛදික යුගයේ යුද්ධයට අධිපති දෙවියා වූයේ කවුරුන් ද?

(1) අග්නි (2) වායු (3) ඉන්ද්‍ර

(4) පර්ජන්‍ය (5) වරුණ (.....)

(32) කුෂාණ රාජ වංශයේ පළමුවන පාලකයා කවුරුන් ද?

(1) ඩීමා කුඩ්පයිසීස් (2) කුජුල කුඩ්පයිසීස් (3) වශිෂ්ක

(4) හුවිශ්ක (5) කණිෂ්ක (.....)

(33) රාෂ්ට්‍රකූටයන්ගේ අගනුවර කුමක් ද?

(1) මදුරෙයි (2) මාන්‍යකේත (3) වාතාපි

(4) කාවේරි (5) තංජෝර් (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(34) සුදර්ශන ජලාශය පළමුවරට ඉදිකළේ කුමන රජ සමයේ ද?

(1) බාරවේල (2) චන්ද්‍රගුප්ත මෞර්ය (3) ස්කන්ධ ගුප්ත

(4) රුද්‍රාදාමන් (5) පළමුවන සාතකර්ණි (.....)

(35) ''මිලින්ද පඤ්හ'' ග්‍රන්ථයේ කතෘ කවරෙක් ද?

(1) මිලින්ද (2) බුද්ධඝෝෂ (3) ධම්මපාල

(4) නාගසේන (5) වසුබන්ධු (.....)

- **අංක 36-40 දක්වා වූ එක් එක් ප්‍රශ්නවලට දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගළ දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

	පළමු ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
1	නිවැරදිය	වැරදිය
2	නිවැරදිය	නිවැරදිය
3	වැරදිය	වැරදිය
4	වැරදිය	නිවැරදිය
5	නිවැරදිය	නිවැරදිවන අතර පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි

	පළමු ප්‍රකාශය	දෙවන ප්‍රකාශය	පිළිතුරු
36	මෙගස්තීනිස්ගේ ඉන්ඩිකා ග්‍රන්ථය මෞර්ය පාලනය පිළිබඳ තොරතුරු සපයන මූලාශයකි.	මෙගස්තීනිස් යනු පාඨලීපුත්‍රයෙහි සිටි ග්‍රීක තානාපතිවරයා ය.	(.....)
37	නාලන්දා විශ්ව විද්‍යාලය සුප්‍රසිද්ධ ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යාපන ආයතනයක් විය.	චීන ජාතික පාහියං තෙරුන් නාලන්දා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීය.	(.....)
38	අශෝක සෙල්ලිපිවල රටවල් නවයකට ධර්ම දූතයන් යැවීම පිළිබඳ සඳහන් වේ.	අශෝක සෙල්ලිපිවල සඳහන් වන අයුරු මහින්ද හිමි ශ්‍රී ලංකාවට වැඩම කරවනු ලැබීය.	(.....)
39	ශකවරු වනාහි දකුණු ආසියාවෙන් පැමිණි සංචාරක ගෝත්‍රයකි.	ශකවරුන් යටතේ වූ ප්‍රදේශ ක්ෂත්‍රපවලය බෙදන ලදී.	(.....)
40	ක්‍රි. ව. අටවන සියවස මුල දී මොහොමඩ් බින් ක්වාසිම් යටතේ පැමිණි අරාබීහු සින්ධ් සහ මුල්තාන් අල්ලා ගත්හ.	අරාබි පාලනය හේතුකොට ගෙන අරාබි රටවල් සමඟ වෙළඳාම ශක්තිමත් වීම, අරාබීන්ට ඉන්දියානු ප්‍රදේශවල පදිංචි වීමට දෙර්‍යදීම සහ වෛද්‍ය හා ජ්‍යෝතීෂය පිළිබඳ ඉන්දීය ග්‍රන්ථ අරාබි භාෂාවලට පරිවර්තනය කිරීම සිදුවිය.	(.....)

SLGURU.LK
For Educational Purpose Only

“The roots of education are bitter, but the fruit is sweet.” — Aristotle (commonly attributed)



Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

විභාග අංකය: .....

ඉන්දීය ඉතිහාසය

25A	S	I,II

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1206 දක්වා

උපදෙස් :

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.

- **II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.**
- **A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් I කොටස සමඟ සපයා ඇත.**

A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(1)	සුලෙයිමාන් කඳු	(5)	වෛශාලි	(9)	සුප්පාරක
(2)	තක්ෂිලා	(6)	කාවේරි ගඟ	(10)	අජන්තා
(3)	හරප්පා	(7)	මදුරෙයි	(11)	ලෝතාල්
(4)	යමුනා ගඟ	(8)	අයිහෝල්	(12)	බැරොඩා කපොල්ල

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)
(ල. 12)

B කොටස

02. පශ්චාත් වෛදික යුගයේ දේශපාලන හා ආර්ථික තත්වයේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ල. 16)

03. ''ඉන්දු නිම්න ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයකි.''
   (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නගර 02 ක් නම් කරන්න. (ල.02)
   (ii) එම ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශවලින් සොයාගත් වැදගත් පුරාවස්තු දෙකක් නම් කරන්න. (ල. 02)
   (iii) ඉන්දු නිම්න වැසියන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)
   (iv) ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? හේතු දක්වන්න. (ල. 08)

04. ''ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යාගේ ආරම්භකයා චන්ද්‍රගුප්ත මෞර්ය රජුය.''
   (i) චන්ද්‍රගුප්ත මෞර්ය රජු විසින් පරාජය කරන ලද අවසාන නන්ද පාලකයා කවුරුන් ද? (ල. 01)
   (ii) චන්ද්‍රගුප්ත මෞර්ය රජු හැර වෙනත් මෞර්ය පාලකයන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)
   (iii) චන්ද්‍රගුප්ත මෞර්ය රජවීමට පෙර ඉන්දියාවේ දේශපාලන තත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)
   (iv) ඉහත සඳහන් ප්‍රකාශය විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ල. 08)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) අලහබාද් ප්‍රශස්තිය.

(ii) පැරණි ඉන්දියාවේ ගණ රාජ්‍ය

(iii) ක්‍රි. පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ රාජධානි.

(iv) මෙගස්තීනිස්ගේ ඉන්ඩිකා

(ලකුණු 8 x 2 = 16)

C කොටස

06. ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තියෙහිලා සමුද්‍රගුප්ත රජුගේ කාර්යභාරය විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ල. 16)

07. ''ගුප්තයන්ගෙන් පසු උතුරු ඉන්දියාව ප්‍රමුඛත්වයට පැමිණියේ හර්ෂවර්ධන රාජ්‍ය සමයේදී ය.''

(i) හර්ෂවර්ධන රාජ්‍ය කාලය පිළිබඳ දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍රයක් නම් කරන්න. (ල. 01)

(ii) ඔහුගේ රාජ්‍ය සමයේදී බෞද්ධ සම්මේලන පැවැත් වූ ප්‍රධාන ස්ථාන 02 ක් නම් කරන්න. (ල. 02)

(iii) ඔහු කනෞජයේ සිංහාසනයට පැමිණි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iv) උතුරු ඉන්දියානු ආධිපත්‍යයේ මධ්‍යස්ථානය බවට කනෞජය පත්කිරීමෙහිලා හර්ෂවර්ධනගේ දායකත්වය සාකච්ඡා කරන්න. (ල. 09)

08. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) ක්‍රි. ව. 7 හා 8 වන ශත වර්ෂවල දී බටහිර සහ වයඹ දිග ඉන්දියාවට එල්ල වූ ආක්‍රමණ විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ල. 16)

(B) පළමුවන රාජ රාජ සහ පළමුවන රාජේන්ද්‍ර යටතේ චෝළ බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙන හැර දක්වන්න. (ල. 16)

09. පහත සඳහන් ඕනෑම මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(i) දෙවන චන්ද්‍රගුප්ත රජු යටතේ අධිරාජ්‍ය ව්‍යාප්තිය.

(ii) හූණ ආක්‍රමණ

(iii) බෙංගාලයේ පාලවරු

(iv) වයඹ දිග ඉන්දියාවේ ශක පාලනය.

(ලකුණු 8 x 2 = 16)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

ඉන්දියා සිතියම



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

01

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය - 2026

13 ශ්‍රේණිය

ඉන්දීය ඉතිහාසය

පිළිතුරු පත්‍රය


I කොටස

01. (3)	02. (4)	03. (4)	04. (3)	05. (4)	06. (5)	07. (4)	08. (4)	09. (3)	10. (4)
11. (3)	12. (4)	13. (3)	14. (4)	15. (3)	16. (3)	17. (2)	18. (3)	19. (4)	20. (5)
21. (3)	22. (2)	23. (5)	24. (4)	25. (3)	26. (4)	27. (1)	28. (5)	29. (3)	30. (1)
31. (3)	32. (2)	33. (2)	34. (2)	35. (4)	36. (2)	37. (1)	38. (3)	39. (4)	40. (5)

II කොටස

A - කොටස

01



නිවැරදිව ලකුණු කිරීම හා නම් කිරීමට ලකුණු 01 බැගින් - 12

01. සිතියම ලකුණු කර ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න.

B කොටස

02. පශ්චාත් වෛදික යුගයේ දේශපාලන තත්වය.

- ඍග් වෛදික යුගයේ පැවති සරල පාලන රටාව මෙම යුගයේ දී සංකීර්ණ තත්වයට පත්වීම.
- රජවරුන්ගේ බලපරාක්‍රමය වැඩි වීම.
- එතරේය බ්‍රාහ්මණයේ රජුන් පහත ආකාරයට බෙද දැක්වීම.
  සම්රාට් - පෙරදිග රජවරු භෝජ - දකුණේ රජවරු
  විරාට් - උතුරේ රජවරු රාජන් - මධ්‍යම ප්‍රදේශයේ රජවරු
- පාලකයන්ට දේවත්වය ආරෝපනය කිරීම.
- රාජ්‍යත්වය පාරම්පරිකව උරුමවීමේ සම්ප්‍රදායක් ඇති වීම.
- අශ්ව මේද, රාජසූය වැනි මහා යාග හෝම චාරිත්‍ර හරහා පාලකයාගේ බලය ඉස්මතු කොට පෙන්වීම.
- ග්‍රාම, විශ්, ජන යන පාලන බෙදීම් තවදුරටත් පුළුල් වීම.
- සමිති සහ සභා යන පාලන සංවිධාන තවදුරටත් පැවති නමුත් රජුට ඒවා යටත් වීම.
- රජුගේ පාලනයට සහාය දැක් වූ රත්නීන් හෙවත් රාජ කර්ණ යනුවෙන් හැඳින් වූ නිලධාරීන් රැසක් සිටීම.
- රජුට ගෙවිය යුතු බදු (බලි) සිය නිෂ්පාදකයන්ගෙන් හෝ ගවයන්ගෙන් හෝ ගෙවිය යුත වීම.
- අධිකරණයේ ප්‍රධානියා රජතුමා වීම.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

- රජුගේ නියෝගයන් අනුව ග්‍රාමණීවරුන් විසින් මෙම දඬුවම් ක්‍රියාත්මක කිරීම. ආදී ලෙස විස්තර කරන්න.

ආර්ථික තත්වය.

- කෘෂි කර්මය පදනම් කරගත් ග්‍රාමීය ආර්ථික ක්‍රමයක් පැවතීම.
- ස්ථාවර කෘෂි කාර්මික ජීවිතයකට හුරු වීම.
- පරිභෝජනයට නොයෙදුන නිෂ්පාදන අතිරික්තයන් ඇති වීම.
- ගව, එළු, බැටළු ආදී සතුන්ගෙන් ලබාගන්නා ලද කිරි, ගිතෙල් වැනි ආහාරපාන භාවිතයට ගැනීම.
- මෙකල ගෘහ කර්මාන්ත හා වෙළඳාම අතින් ද ආර්ථිකය ශක්තිමත් වීම.
- ගංගා ආශ්‍රිත සරුබිම්වල කෘෂි කර්මාන්තය ව්‍යාප්තව තිබීම.
- ප්‍රධාන වර්ණ හතර මුල් බැස ගැනීමත් සමඟම වෛශ්‍ය කුලයේ අය වෙළඳාම, ගොවිතැන් කටයුතු හා මූල්‍ය කටයුතුවල නිරත වීම.
- යාගහෝම, බලි බිලි පූජාවලට සතුන් ලබා ගැනීම සඳහා සත්ත්ව පාලනය ද තිබුණි.
- සතුන් සිය ගණනක් මරා බිලි පූජා කරන යාඥා වර්ධනය වීම.
- ආර්ථිකයේ ප්‍රධාන අංගයක් වූයේ අජු විසින් ලබාගන්නා බලි, ශුල්ක හෙවත් භාග වශයෙන් හැඳින් වූ ඉදු අය කිරීමයි. ගවයන්ගෙන් හෝ නිෂ්පාදනවලින් කොටසක් රජුට බදු ගෙවන ලෙදී.
- භාගධුග නිලධාරියා මේ බදු එකතු කිරීමට පත් කළ නිලධාරියාය.
- භූමියෙන් ලැබෙන නිෂ්පාදන වලින් 1/6 ක් 1/8 ක් 1/10 ක් බදු අය කළහ.
- ගව සම්පතින් 1/5ක් වාණිජ භාණ්ඩවලින් 1/20 ක් රජයට බදු ගෙවිය යුතු විය.
- මෙකල වෙළඳ කටයුතු ගම් මට්ටමින් ගොඩබිම් මාර්ග හා ගංගා ඔස්සේ පවත්වාගෙන ගියහ.
- මෙකල වෙළඳාමය සම්බන්ධ වූ කුඩා වෙළඳ නගර ලෙස උදේනි, කෞශම්බි, බරණැස, ශ්‍රාවස්ති යන නග හැඳින්විය හැක.
- විවිධ නිෂ්පාදනවලින් ද ආර්ථිකය සකස් කර ගනි.
- මෙකල විවිධ කර්මාන්ත කළ විවිධ ශ්‍රේණි තිබිණි.
- රන්කරුවන්, වඩුවන්, රෙදි වියන්නන්, සම්භාණ්ඩ තනන්නන්, ලෝහ භාණ්ඩ තනන්නන්, මැටි භාණ්ඩ තනන්නන් තම නිෂ්පාද වෙළඳපලට ගෙනවිත් භාණ්ඩ හුවමාරු කර තම අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නා ලදී. ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 16)

03. (i) මොහෙන්ජොදාරෝ, හරප්පා, චන්හුදාරෝ, කලිබන්ඝන්, රූපාර්, ලෝතාල්, රංග්පූර්, ඉුදෙයිජොදාරෝ, ආමරි, දාබර්කොට්

(ii)
- ලෝහ ප්‍රතිමා
- පූජක රූපය
- මව් දෙවඟන ප්‍රතිමා
- පශුපති මුද්‍රාව
- නාටිකාංගනාව
- ඇං සහිත දේව මුද්‍රාව
- මොල්ලිය සහිත ගව මුද්‍රාව
- නාන තටාකය
- කවන්ධ නග්න මිනිස් රූප දෙක
- සත්ත්ව රූප කැටයම් කළ මුද්‍රා

(iii)
- කෘෂි ආර්ථිකය වඩාත් ප්‍රබල ලෙස ව්‍යාප්තව පැවතීම.
- මෙහි ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් පැවති අතර විවිධ ධාන්‍ය වර්ග වගා කිරීම.
- සින්දු නදිය පිටාර ගැලීම නිසා ඒ අවට සශ්‍රීක බිමෙහි ධාන්‍ය වගා කළහ. එහි තිබූ මහා ධාන්‍යාගාරය අනුව ධාන්‍ය වගාව පුළුල් ලෙස පැවති බව.
- තිරිඟු, බාර්ලි, යව ආදී ධාන්‍ය වර්ග මෙන් ම රට ඉඳි කපු වගා කළ බවට සාක්ෂි ලැබීම.
- ග්‍රාමීය සමාජයේ නිෂ්පාදන අතිරික්තයක් පැවතීම නිසා ධාන්‍ය ගබඩා කිරීමට අවශ්‍ය වීම.
- හරප්පා, මොහෙන්ජොදාරෝ ප්‍රධාන නගර දෙක මුල් කරගෙන අභ්‍යන්තර වෙළඳාම ද පැවතීම.
- ධාන්‍ය වර්ග, ආභරණ වර්ග හා ගෘහ භාණ්ඩ ආදිය අභ්‍යන්තර වශයෙන් හුවමාරු කර ගැනීම මෙන් ම වෙළඳාමට ද යොදා ගැනීම.
- විදේශ වෙළඳාමට වැදගත් තැනක් ලැබීම.
- වෙළඳුන් තම භාණ්ඩ තවලම් හෝ නැව් මඟින් විදේශ රාජ්‍යවලට ප්‍රවාහනය කළ බවට සාධක ලැබීම.
- කාර්මිකයන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය විදේශවලින් ගෙන්වා ගැනීම.
- රත්රන් මයිසූර් ප්‍රදේශයෙන් ද, රිදී ඉරානයෙන් ද, තඹ රාජපුතානාවෙන් ද ගෙන්වා ගන්නට ඇත.
- බාහිර ලෝකය සමඟ වෙළඳ සබඳතා පැවැත් වූ වරාය ලෙස ලෝතාල් වරාය වැදගත් වීම.
- එසේම රංග්පූර් වරාය ද විදේශ වෙළඳාමට සම්බන්ධ වූ වරායක් වීම.
- මේ හැර විවිධ ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදුනු බවට විවිධ සාක්ෂි හමුවීම. ගඩොල් නිෂ්පාදනය, වළං නිපදවීම, සිප්පි කටු කර්මාන්තය, ආභරණ තැනීම, පේෂ කර්මාන්තය වැනි නිෂ්පාදනවල මිනිසුන් නිරත වී සිටි බවට සාක්ෂි ලැබීම. ආදී ලෙස විස්තර කරන්න. (ල. 04)

(iv) මෙම ප්‍රකාශයට එකඟ විය හැක.
- සැලසුම් සහගත නගර නිර්මාණයක් එහි දක්නට ලැබේ.
- නගරය ඇතුළු නුවරකින් හා පිටි නුවරකින් සමන්විත විය.
- ඇතුළු නුවර ගොඩනැඟිලි උස් අත්තිවාරමක් මත ඉදි කර තිබීමෙන් ඒවා ජල ගැලීම්වලින් ආරක්ෂා කර ගැනීමට හැකි වීම.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

- ප්‍රාකාරවලින් ඒවා තව දුරටත් ආරක්ෂාව ලැබීම.
- නගරයේ ජනතාව පිටිනුවර වාසය කළ අතර එහි නිවාස පවා ක්‍රමානුකූලව ගොඩනඟා තිබීම. පිළිස්සූ ගඩොල් වැඩි ප්‍රමාණයක් භාවිතා කර තිබූ අතර, හදිසි ජල ගැලීම් වලින් ඒවා ආරක්ෂා විය. නගරයේ පවිත්‍රතාවය රැක ගැනීමට ක්‍රමානුකූලව කාණු පද්ධතියක් ගොඩ නඟා තිබීමද විශේෂ නාගරික ලක්ෂණයකි.
- එමෙන් ම නාගරීකරණය වූ මෙහි සෞඛ්‍ය පහසුකම් සලසා තිබීම.
- මහල් නිවාස ඉතා අලංකාර වීම. ඉහළ මාලය දැවයෙන් තනා තිබූ අතර, මැද මිදුලක් සහිත විය.
- ගෙවල්වලින් බැහැර කරන ජලය මාර්ගයේ කාණුවලට යොමු කර තිබීම නිසා ක්‍රමානුකූල ජලප්‍රවාහන පද්ධතියක් තිබූ බවට කිව හැක. නිවාසවල දොරටු ප්‍රධාන වීථිවලට විවෘත නොවන ලෙස තනා තිබීමෙන් ආරක්ෂාව ගැන වැඩි අවධානයක් යොමු කළ බව පෙනේ.
- කම්කරු නිවාස පේළි ලෙස තනා තිබූ අතර ඒ අසල ධාන්‍යාගාර හා ලෝහකුරුකරුවන්ගේ නිවාස තිබෙන්නට ඇත.
- නාන තටාකය ද ප්‍රධාන ආගමික ගොඩනැගිල්ලක් ලෙස ඇතුල් නුවර පිහිටා තිබුණි.
- සමාජය ද ස්ථර දෙකකට බෙදී තිබිණි. කම්කරු හා නාගරික ජනතාව වෙන වෙන ම වාසය කළ බවට ගෙවල්වල පිහිටීම අනුව නිශ්චය කළ හැක.
- නගරවල ප්‍රභූ ජනයා මහල් නිවාසවල සුඛෝපභෝගී ජීවිත ගත කළ බව පෙනේ. එමෙන් ම නගරයේ ධනවත් වෙළඳ පන්තියක් සිටි අතර බොහෝ නාගරික ජනතාව ඉස්තරම් ආභරණ ඇඳුම් පැළඳ සිටි බවට සාධක ඇත..... ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 08)

04. (i) ධනනන්ද

(ii) බින්දුසාර, අශෝක, කුණාල, බෘහද්රථ, ජලෞක

(iii)
- ක්‍රි. ව. 6 වැනි සියවසේ දී හර්යංක වංශික සේනිය බිම්බිසාර රජුගෙන් මගධයේ නැගීම ආරම්භ වීම.
- සරුසාර ගම් අසූදාහක් යටත් කර ගනිමින් මගධය බලවත් රාජ්‍යයක් බවට පත් කිරීම.
- ඉන් පසුව කාලාශෝක රජු ශිශුනාග පරපුරේ පාලකයා ලෙස බලයට පත් වූව ද ඔහු ඝාතනය කර පහත් යැයි සම්මත ගෝත්‍රයක උපන ලද මහා පද්මනන්ද නම් දක්ෂ සටන් කරුවෙකු විසින් මගධයේ බලය ලබා ගැනීම.
- මෙතෙක් බලය ලබා ගෙන සිටි ක්ෂත්‍රීය වංශයත් විනාශ කොට රාජ්‍ය බලය සම්පූර්ණයෙන් ම ඔවුන් වෙතින් උදුරාගත් අයකු ලෙස මහා පද්මනන්ද හැඳින්විය හැක. ක්‍රි. පූ. 322 ඔහු බලය පැවති බව මූලාශ්‍රවල සඳහන් වේ.
- ඉන් පදු මහා පද්මනන්ද හා ඔහුගේ පුතුන් 08 දෙනා මගධය පාලනය කළ අතර ඔවුන් පණ්ඩු, පණ්ඩුගති, භූතපාල, රාෂ්ට්‍රපාල, ගොවිශානක, දශසිද්ධ, කෛවර්ත, ධන වන අට දෙනා මගධය පාලනය කළ අතර අවසක් පාලකයා වූ ධනනන්ද බලවත් පාලකයෙකු විය.
- මොහුට විශාල හමුදාවක් හා යුධ බලයක් පැවති බව ග්‍රීක වාර්තාවල සඳහන් වේ. එම නිසා ග්‍රීක ආක්‍රමණිකයන් රට අභ්‍යන්තරයට පිවිසීමට පවා අපොහොසත් විය.
- උතුරින් හිමාලයා කඳුවැටිය හා දකුණින් වින්ධ්‍යා කඳු වැටිය දක්වා ධනනන්දගේ බලය ව්‍යාප්ත වී පැවතින.
- ඔහුගේ විශාල හමුදාව නඩත්තු කිරීමට දනය ලබා ගැනීම සඳහා ප්‍රජා පීඩක බදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී.
- අධික වස්තු තණ්හාවක් තිබීමත්, නන්ද රාජ වංශය කුල හීන පෙළපතකින් පැමිණීම නිසා මහජනයා නන්ද පෙළපත කෙරෙහි අප්‍රසාදයෙන් සිටි බවත්, මේ නිසා නන්ද රාජ වංශය කෙරෙහි කළකිරුණු ජනතාවගේ සහාය මෞර්ය රාජ වංශයේ චන්ද්‍රගුප්ත මෞර්ය රජුට ලැබුණු අතර ඒ අනුව ධනනන්ද පරාජය කර අලුත් රාජ වංශයක් ගොඩ නැගීමට මොහුට පිටුබලයක් ලැබුණි. .... ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 05)

(iv)
- ක්‍රි. පූ. හයවැනි සියවසින් ආරම්භ වන මගධය මුල්කොට ගෙන අධිරාජ්‍ය සංකල්පය සාර්ථක කරගත් පළමු පාලකයා වන්නේ චන්ද්‍රගුප්ත මෞර්ය රජුය.
- ක්‍රි. පූ. 324 - 300 මෙතුමාගේ රාජ්‍ය කාලය වේ.
- නන්ද පාලකයෙකුට දාව මූරා නම් කාන්තාවකගේ කුසින් මොහු උපන් බව පුරාණ ග්‍රන්ථ මූලාශ්‍රවල සඳහන් වෙයි.
- මොහු කුඩා කාලයේ දීම කෞටිල්‍ය හෙවත් චානක්‍ය බමුණාට මුණගැසුනු අතර, ධනනන්ද රජුගේ රාජකීය දාන ශාලාවේ සේවය කරමින් සිටිය දී ධනනන්ද හා උරණ වූ කෞටිල්‍ය ඔහුගෙන් පළිගැනීමට සිතා චන්ද්‍රගුප්ත මෞර්ය රජු යොදා ගැනීමට සිතා ගනී.
- අවුරුදු 08 ක් ශිල්ප ශාස්ත්‍ර උගන්වා වින්ධ්‍යා වනයට පැමැණ විශාල යුධ හමුදාවක් සකස් කර ගන්නා ලදී.
- හොරුන්, මංකොල්ලකරුවන්, මිලේච්ඡයන්ගේ සමන්විත දක්ෂ හමුදාවක් මෙහෙයවා ධනනන්ද පරාජය

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

කර කෞටිල්‍යගේ උපදෙස් මත ක්‍රි. පූ. 324 දී මගධයේ පාලකයා බවට පත් වීම.

- ග්‍රීක මූලාශ්‍රවල සන්ද්‍ර කොට්ටාස් නමින් හඳුන්වා ඇති චන්ද්‍රගුප්ත ධනනන්ද පරාජය කිරීම සඳහා ග්‍රීක සහාය ලබාගත් බව ද සඳහන් වේ.
- ඉන්දියාවේ විශාල අධිරාජ්‍යයක් ගොඩනැඟූ චන්ද්‍රගුප්ත වයඹ දිගින් තම රාජ්‍ය විශාල කර ගැනීම සඳහා සටනක් ද මෙහෙය වීය.
- ඇලෙක්සැන්ඩර් රජුගෙන් පසු වයඹ දිග ඉන්දියාවේ බලය අල්ලා ගෙන සිටි සෙලියුකස් නිකේටර් සමඟ ගිවිසුමකට එළඹීමෙන් පසු ග්‍රීකයන්ට අයත්ව තිබූ ආරියා, ඇරකෝෂියා, පරෝපනිසදායි, ගෙඩ්රෝෂියා (කාබුල්) යන ප්‍රදේශ චන්ද්‍රගුප්තට හිමිවීම.
- ග්‍රීක තානාපතියෙකු ලෙස මෙගස්තීනිස් පාඨලීපුත්‍ර නගරයට එවීම.
- සෙලියුකස්ගේ දියණියක් චන්ද්‍රගුප්ත රජුට විවාහ කර දීම. ඒවෙනුවට චන්ද්‍රගුප්ත විසින් සෙලියුකස්ට ඇතුන් 500 ක් තෑගී කරන ලදී.
- මේ නිසා මෞර්ය අධිරාජ්‍ය පර්සියාවේ නැගෙනහිර අධිරාජ්‍ය දක්වා ව්‍යාප්ත වීම..... ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 08)

05. කෙටි සටහන් ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ල. 8 x 2 = 16)

C කොටස

06.
- සමුද්‍රගුප්ත රජුගේ රාජ්‍ය ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු දැක්වෙන වැදගත්ම මූලාශ්‍රය වන්නේ හරිසේන කවියා විසින් රචිත අලහබාද් ප්‍රශස්තියයි.
- I වන චන්ද්‍රගුප්ත හා ලිච්ඡවී වංශික කුමාර දේවියගේ පුත් සමුද්‍රගුප්ත ක්‍රි. ව. 335 සිට 376 පමණ වනතුරු පාඨලීපුත්‍රය මුල් කරගෙන ගුප්ත අධිරාජ්‍ය පාලනය කළේය.
- I වන චන්ද්‍රගුප්ත විසින් තම පුත් සමුද්‍රගුප්තට රාජ්‍ය පවරා දීමෙන් පසු අභියෝග රැසකට මුහුණ දෙමින් අධිරාජ්‍ය ව්‍යාප්ත කිරීමේ දිග් විජය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- පාඨලී පුත්‍රය අගනුවර කරගනිමින් දිග් විජය ප්‍රතිපත්තිය මඟින් ඔහු ඇසෑමය, බෙංගාලය, පංජාබය, ඩෙකැනය පසු කරමින් කාංචිය දක්වාද, උජ්ජේයිනිය, මාල්වා, කතියවාර් දක්වාද බලය ව්‍යාප්ත කර ගැනීම.
- ආර්යවර්තයේ රජවරුන් නවදෙනෙකු යටත් කර ගැනීම.
- ඔවුන් යටත් කර ගැනමෙන් පසු සමුද්‍රගුප්ත රජුට ගංගා - යමුනා තැනිතලාවේ ආර්ථික ශක්තිය ලබා ගැනීම.
- ඉන් පසුව අටවිකවරුන් පරාජය කිරීම. වින්ධ්‍යා කඳුවැටිය ප්‍රදේශයේ විසූ සටන්කාමී ගෝත්‍රික ජනතාවක් පරාජය කිරීමෙන් අනාගතයේ සිදු කිරීමට අපේක්ෂා කරන දක්ෂිණාපථ ආක්‍රමණයට පෙර සූදානමක් ඇති කර ගැවීම.
- අලහබාද් ප්‍රශස්තියට අනුව සමුද්‍රගුප්තගේ සටන් ව්‍යාපාරය අවස්ථා කීපයක් යටතේ සිදු කිරීම.
- ආර්යවර්තයේ රජුන් නව දෙනෙකු යටත් කිරීම, අටවික රජවරු පරාජය කිරීම. දක්ෂිණා පථය ජය ගැනීම. - (පාලකයන් 12 දෙනෙකු පරාජය කිරීම.) ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 16)

07. (i) හර්ෂ චරිතය, හියුංසාගේ වාර්තා, රත්නාවලී, ප්‍රියදර්ශිකා, නාගානන්ද (ල. 01)

(ii) අලහබාද්, කනෞජය, ප්‍රයාග (ල. 02)

(iii)
- ථානේශ්වරයේ පුෂ්‍යභූති රාජ වංශයේ බලවත් ම පාලකයා වූයේ ප්‍රභාකරවර්ධනයි.
- ප්‍රභාකරවර්ධනගේ පුතුන් දෙදෙනා වූයේ රාජ්‍යවර්ධන හා හර්ෂවර්ධනයි.
- දියණිය වූයේ රාජ්‍ය ශ්‍රී දේවියයි.
- ථානේශ්වරයේ ශක්තිය තවදුරටත් තහවුරු කර ගැනීමේ බලපොරොත්තුවෙන් පුෂ්‍යභූති රාජවංශය කන්‍යාකුබ්ජයේ මෞඛරී රාජ වංශය සමඟ ද සම්බන්ධකම් ඇති කර ගන්නා ලදී.
- කන්‍යාකුබ්ජයේ ඔටුන්න හිමි කුමරා වූ ග්‍රහවර්මන්ට ථානේශ්වරයේ ප්‍රභාකරවර්ධන රජුගේ දියණිය විවාහ කර දීම නිසා ථානේශ්වරයේ හා කාන්‍යාකුබ්ජය අතර දේශපාලනය සම්බන්ධාවයක් ඇති වීම.
- ගුප්තයන්ගෙන් පසු බටහිර ඉන්දියාවේ දේශපාලන ආධිපත්‍ය සඳහා ඉදිරිපත් වූ තවත් රාජ්‍ය දෙකක් වූයේ මාල්වා හා ගෞඩව රාජ්‍යයන්ය.
- ප්‍රභාකරවර්ධන රජුගේ මරණින් පසු මාල්වා පාලක දේවගුප්ත රජු කන්‍යාකුබ්ජය ආක්‍රමණය කොට ප්‍රභාකරවර්ධනගේ සිහසුනට උරුමව සිටි ග්‍රහවර්මන් මරණයට පත්කොට දේව රාජ ශ්‍රී කුමරිය සිරභාරයට ගත්තේය.
- මේ පුවත සැල වූ ථානේෂ්වරයේ රාජ්‍යවර්ධන රජු තම සොහොයුරු හර්ෂවර්ධන කැඳවා අගනුවර භාරකොට සතුරාගෙන් තම නැගණිය බේරා ගැනීම හා ඇගේ සැමියා මරා දැමීම පිළිබඳ පළිගැනීමේ පරමාර්ථයෙන් ප්‍රබල හමුදාවක් රැගෙන මාල්වා ආක්‍රමණය කොට දේවගුප්ත මරා දැමීය.
- එහෙත් එහි දී රාජ්‍යවර්ධන රජු ගෞඩව දේශයේ සසංක රජු අතින් මරණයට පත්විය. මෙම සිද්ධීන්ගේ ප්‍රතිඵලය වූයේ ථානේශ්වරයේ සහ කන්‍යාකුබ්ජයේ සිංහාසනය හිස්වීමයි.
- මෙවැනි පසුබිමක් යටතේ ථානේශ්නරයේ හා කන්‍යාකුබ්ජයේ සිහසුන හර්ෂවර්ධනයට හිමි විය.
- හර්ෂවර්ධන තම සොයුරිය බේරා ගැනීම සඳහාත්, තම සොහොයුරා මැරූ සසංකගෙන් පළි ගැනීම සඳහාත් සටන් ඇරඹීය.

SLGURU.LK
For Educational Purpose Only

- මෙම සටනින් ජයගත් හර්ෂවර්ධන රජු ථානේශ්වර රාජ්‍ය හා කන්‍යාකුබ්ජය ඒකාබද්ධ කර පැවති ප්‍රදේශ පාලනය කිරීම ආරම්භ කළේ ය.... ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 04)

(iv)
- උතුරු ඉන්දියානු ආධිපත්‍යයේ අවසාන බල මධ්‍යස්ථානය වූයේ කනෞජයයි.
- භානබට්ට පවසන පරිදි හර්ෂවර්ධන ජයකාහල හඬ නංවමින් දිග් විජය ඇරඹුවේ ඉන්දියාවේ සියලුම රාජ්‍යයන්ය තම අධිරාජ්‍යයන්ට යටත් වීමට හෝ යුද්ධයට මුහුණ දීමට යන දෙකින් එකක් තෝරාගන්නා ලෙස දක්වා සිටීම.
- දිග් විජය ව්‍යාපාරය ආරම්භ කළ හර්ෂවර්ධන රජු තම සොයුරිය රජකම ප්‍රතික්ෂේප කළ බැවින් ඇමතිවරුන්ගේ ඉල්ලීම මත මහා රාජ යන විරුදය ගෙන කන්‍යාකුබ්ජයේ සිහසුන භාර ගැනීම.
- ථානේශ්වරය හා කන්‍යාකුබ්ජය ඒකාබද්ධ කොට කන්‍යාකුබ්ජය කේන්ද්‍ර කොටගෙන පාලනය ගෙන යාම.
- රජුගේ දිග් විජය ප්‍රතිපත්තිය හේතුවෙන් වලභි හා ගුර්ජර පාලකයන් සමඟත්, චාලුක්‍ය වංශයේ දෙවන පුලකේශීන් සමඟත්, ඉන්දු නිම්නයේ රාජ්‍ය සමඟත්, මගධ, ගෞඩ, අවුද් හා කොංගෝ රාජ්‍ය සමඟත් සටන් කිරීම.
- ක්‍රි. ව. 612 දී පමණ උතුරු ඉන්දියාවේ බටහිර කොටසේ තිබූ වැදගත් රාජ්‍යයක් වූ මෛත්‍රික රාජ වංශය යටතේ පැවති වලභි රාජ්‍යයයි.
- ප්‍රභාකරවර්ධනගේ කාලයේ සිටම ථානේශ්වරයේ ප්‍රබල සතුරා වූයේ මෙම බලවත් රාජ්‍යයයි. වලභි රාජ්‍යයට හර්ෂවර්ධනගේ ප්‍රහාර එල්ල වූ අතර එයිනුත් හර්ෂවර්ධන ජය ගත්තේය. මෙම ජයග්‍රහණයෙන් පසු හර්ෂවර්ධන රජු තම දියණිය වලභි පාලක ධ්‍රැවසේනට විවාහ කර දුන් බව ද, එම විවාහයෙන් පසු වලභි රාජ්‍යයේ ස්වාධීනත්වය ආරක්ෂා වූ බව ද මූලාශ්‍රවල සඳහන් වේ.
- හර්ෂවර්ධන රජු මීලඟට කම ආක්‍රමණය මෙහෙයවූයේ වාතාපිපුර චාලුක්‍ය දෙවන පුලකේෂීන් රජුට විරුද්ධවය. දෙපක්ෂය අතර සටන නර්මදා නදිය අසල සිදුවිය.
- හර්ෂවර්ධන රජු විශාල හමුදාවක් හා සියලු ප්‍රාදේශීය යුද්ධ නායකයන් කැඳවාගෙන තමන්ම සටන මෙහෙය වූ බව හියුංසාං සඳහන් කරන්න... ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 09)

08. (A)
- පෙරදිග වෙළෙඳ කටයුතුවල නිරතව ඉන්දියාවත්, රෝමයත් අතර වෙළඳාමේ අතරමැදියන් ලෙස කටයුතුවලට සම්බන්ධ වීම.
- සිරියාව, පලස්තීනය, ඊජිප්තුව වැනි ප්‍රදේශ යටත් කරගත් අරාබීන් පෙරදිගට අවධානය යොමු කළ අතර පර්සියාව යටත් කර ගැනීමෙන් පසුව ඉන්දියාව කෙරෙහි අවධානය යොමු කිරීම.
- මුලින්ම උතුරු ඉන්දියාවට වරින් වර ආක්‍රමණ එල්ල කරන ලදී.
- මෙම ආක්‍රමණ ආරම්භ වූයේ මදිනාවේ කාලිෆ් වංශයේ දෙවැන්නා වූ ඔමාර් කාලිෆ්ගේ අවධියේ ය.
- මුල් අරාබි ආක්‍රම එල්ල වූයේ මුහුදු මාර්ගවලිනි.
- මුල් ආක්‍රමණය ක්‍රි. ව. 637 දී බොම්බායේ තානාවලට එල්ල වූ අතර, ඉන් අනතුරුව බ්‍රෝච් (භරුකච්ච) හා දෙබාලල් (සින්දු නදී මෝය.) යන ප්‍රදේශවලට ආක්‍රමණ එල්ල වීම.
- නාවික මධ්‍යස්ථානවලට ආක්‍රමණ එල්ලවීමෙන් පෙනී යන්නේ ඒවායේ අරමුණ ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත කිරීමට වඩා ධනය කොල්ලකෑම බවයි.
- ක්‍රි. ව. 712 දී මොහොමඩ් ඉබ්න් කාසීම් විශාල හමුදාවක් ඇතිව සින්ධ් ආක්‍රමණය කොට දෙබාල් යටත් කරගත් අතර එම සටනේ දී සින්ධ් පාලකයා මිය ගිය අතර ඉන්පසු කාසීම් මුල්ථාන් යටත් කරගෙත්තේය.
- වයඹ දිග ඉන්දියාවට එල්ල වූ අරාබි ආක්‍රමණය අතුරින් තරමක් දුරට හෝ සාර්ථක වූයේ මෙම ආක්‍රමණය යි.
- මොහොමඩ් ඉබන් කාසීම් තම ජයග්‍රහණවලින් පසු කාන්‍යාකුබ්ජයට හා කාශ්මීරයට ආක්‍රමණ එල්ල කළ නමුත් ඒවායින් පරාජයට පත් විය.
- දහවන සියවසේ අගභාගයේ දී එල්ල වූ මුස්ලිම් ආක්‍රමණ ඉන්දියාවේ මුස්ලිම් බලය පැතිරවීමේ තවත් වැදගත් පියවරක් ලෙස සැලකිය හැකිය.
- මෙම ආක්‍රමණ මෙහෙය වූයේ සබුක්තිජින් වන අතර ඔහුට පසුව පැමිණි ඝෂ්නියේ මහමුද් ප්‍රබලම ආක්‍රමණිකයා විය. ඔහු අඩුම වශයෙන් දාහත් වතාවක් ඉන්දියාව ආක්‍රමණය කළ බව විශ්වාස කරයි.
- ඝෂ්නි රාජ්‍යයට නැගෙනහිරින් පිහිටි රාජ්පුත්වරුන්ගේ පන්ජාබ් රාජ්‍යයට ආක්‍රමණ එල්ල කරමින් ඉන්දීය ආක්‍රමණ ආරම්භ කළ සබුක්තිජින් උපාය කෞශල්‍යය හා ධෛර්යවන්තභාවය ද ඇතිව තම පුත් මොහොමඩ්ගේ සහයෙන් රාජ්පුත් පාලක ජයපාල පරාජය කළේය.
- සබුක්තිජින්ගේ අවැමෙන් ඔහුගේ පුත් මහමුද් ඝෂ්නියේ පාලකයා බවට පත් විය. ඔහු ආරම්භයේ දී කාබුල් හා කන්දහාර් ඇඳාගෙන තම රාජ්‍යය ස්ථාවර කර ගන්නා ලදී. ඊට පසු රාජ්පුත් රාජ්‍යය වෙත නිරන්තර ආක්‍රමණ එල්ල කරන ලදී.

SLGURU.LK

- ඝෂ්නියේ මහමුද් ඉන්දියාවට පිවිසෙන දුර්ග මාර්ගය වූ ඛයිබර් දුර්ගය දිනා ගැනීම මුස්ලිම් ලෝකයට ඉන්දියාවේ දොර විවෘත කිරීමක් බඳු විය. .... ආදී වශයෙන් විස්තර කරන්න. (ලැ. 16)

(B) I වන රාජ රාජ

- තංජෝරයේ චෝළ රාජවංශය නමින් ද, විජයාලය රාජවංශය නමින් ද හැඳින්වෙන චෝළ අධිරාජ්‍යයට පදනම ලබන ලද්දේ I වන රාජ රාජ රාජ්‍ය සමයේ බව විශ්වාස කිරීම.
- I වන රාජ රාජ චෝළ රජු චෝළ නාවික බලය වර්ධනය කර දකුණේ බලවත් වූ චේර (කේරළ) නීවාක හමුදාව කන්දලූර් (ත්‍රිවේන්දාම්) හී දී විනාශ කරන ලදී.
- මදුරාව ජයගෙන අමරභුජංග නම් පාණ්ඩ්‍ය රජු අල්ලා ගැනීම හා කුඩාමලෙයිනාඩු හෝ කුරිග් නම් ස්ථානයට ආක්‍රමණයන් මෙහෙයවා එහි වූ උදගෙයි බලකොටුව ද අයිති කර ගැනීම.
- එම බලකොටු අයත් කර ගැනීමේ අරමුණ වුයේ පාණ්ඩ්‍ය හා කේරූ බලය මර්ධනය කිරීමයි.
- මේ වන විට ලංකාවේ රජ ව සිටි පස්වන මිහිඳු තම අගනුවර ඇති වූ කලබලකාරී තත්වය මැඩ පවත්වා ගත නොහැකිව රුහුණට පලාගොස් සිටියේය.
- මෙම අරාජික තත්වය දැනගත් I වන රාජ රාජ රජු අනුරාධපුරය ආක්‍රමණය කොට එම ප්‍රදේශය අල්ලා ගත්තේය.
- ඔහු බටහිර ගංගා රටේ පාලන ප්‍රදේශ තුනක් වන ගංගාවාඩිය, තඩිවාඩිය, කොලොම්බවාඩිය ජය ගත්තේය.
- 10 වන සියවසේ දී පමණ නැගෙනහිර චාලුක්‍ය රාජ්‍යයේ එනම් වෙංගියේ උද්ගත වූ දේශපාලන ව්‍යාකූලත්වයෙන් ප්‍රයෝජනය ගෙන එහි දේශපාලන කටයුතුවලට මැදිහත් වීම.
- දේශපාලන ව්‍යාකූලත්වයෙන් පැවති කාලයේ දී ඔහු ශක්තිවර්මන්ව රාජ්‍යත්වයට පත් කොට තම දියණිය රජුගේ සොහොයුරාට විවාහ කර දුන්නේය. මෙමඟින් නැගෙනහිර වාලුක්‍ය ප්‍රදේශය තමාට අවනත කර ගත්තේය.
- රාජ රාජ රජු කාලිංගය ද ජය ගත්තේය.
- ඔහුගේ ප්‍රමුඛතම ජයග්‍රහනය ලෙස සැලකෙන්නේ දූපත් දොළොස් දාහ නමින් හැඳින්වෙන මාල දිවයින් ජය ගැනීමයි.
- මේ අනුව ඔහුගේ අධිරාජ්‍යය තුංග භද්‍ර නදිය දක්වා මුළු දකුණු ඉන්දියාවමද මලදිවයින සහ ශ්‍රී ලංකාවේ උතුරු කොටස යන ප්‍රදේශ ද අයත් විය..... ආදී වශයෙන් විස්තර කරන්න.

I වන රාජේන්ද්‍ර චෝළ

- I වන රාජේන්ද්‍ර රජ වීමට පෙර සිටම පිය රජුගේ පාලන කාර්යවල යෙදීම නිසි අත්දැකීම් ලැබූ අයෙකි.
- I වන රාජේන්ද්‍ර මෙහෙය වූ සටන් පිළිබඳව විස්තර ඔහුගේ අභිලේඛනවල සඳහන් වේ.
- ඔහු විසින් යටත් කර ගත් ඉන්දියාවෙන් දකුණ ප්‍රදේශවලට අමතරව ශ්‍රී ලංකාවේ උතුරු කොටස, මාලදිවයින, ආරාබි මුහුදේ දූපතක් වූ සන්දිමන්නතිව් සහ බෙංගාලයේ නැගෙනහිර හා දකුණු ප්‍රදේශ ඔහුගේ අධිරාජ්‍යයට යටත් විය.
- I වන රාජේන්ද්‍ර රජු ක්‍රි. ව. 1018 දී ශ්‍රී ලංකාවට හමුදාවක් එවා රුහුණේ සිටි V වන මිහිඳු රජු සිරකරුවෙකු ලෙස අල්ලාගෙන චෝළ රටට ගෙන යන ලදී.
- ශ්‍රී ලංකාවේ චෝළයන්ට අයත් ප්‍රදේශ මුම්මඩිචෝළ මණ්ඩලම් නමින් ද, පොළොන්නරුවේ ජනනාථ මණ්ඩලය නමින් ද හඳුන්වා ඇත.
- එම ප්‍රදේශ චෝළ ප්‍රාන්තයක් ලෙස පවත්වා ගෙන ගොස් ඇත.
- කේරලය හා පාණ්ඩ්‍ය යටත් කරගත් රජු එම ප්‍රදේශ පාලනය කිරීමට තම පුත් කුමරා පත් කර ලදී.
- රාජේන්ද්‍ර රජුගේ ඊළඟ ආක්‍රමණය සිදුවූයේ උතුරු ඉන්දියානේ නැගෙනහිර පෙදෙසටය. මෙම ආක්‍රමණයෙන් ගංගා නදියේ උතුරේ හා දකුණේ පාලකයන් යටත් කළ බව සඳහන් වේ.
- ඊළඟට චෝළ රජුගේ අවධානය යොමු වූයේ ඉන්දියානු සාගරයේ වෙළඳ අධිකාරය ලබා ගැනීමටය. ඔහු එම අරමුණෙන් අග්නිදිග ආසියාතික සමුද්‍රාසන්න රාජ්‍යවලට ද ආක්‍රමණ මෙහෙයවමින් සිටියේ ය.
- නිකොබාර් සහ ඉස්මුස් ඇතුළු දූපත් ගණනාවක් ඔහුට අයත්ව තිබීම.
- මෙම සංග්‍රාමය තුළින් විජයෝත්තුංගවර්මන් යටතේ පාලනය වූ ශ්‍රී විජය රාජ්‍යයට අයත් සුමාත්‍රාව, ජාවා හා මලය අර්ධවීපය ද යටත් කර ගත් අතර මේ මඟින් ඉන්දියන් සාගරයේ අග්නිදිග ආසියාකරයේ වෙළඳාම පාලනය කිරීමට චෝළයන්ට හැකි විය..... ආදී වශයෙන් විස්තර කරන්න.

(ලැ. 16)

09. කෙටි සටහන් ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ලැ. 8 x 2 = 16)

SLGURU.LK
For Educational Purposes Only

“The roots of education are bitter, but the fruit is sweet.” — Aristotle (commonly attributed)



Visit SLGURU.LK to download papers and notes.